මගේ අංකය - ED/02/20/01/2023

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 353, කෝට්ටේ පාර
රාජගිරිය

2022.09.19

සුරාබදු ස්ථානාධිපතිවරුන් මගින්
ප්‍රධාන සුරාබදු පරීක්ෂක/ සුරාබදු පරීක්ෂකවරුන් වෙත

**වාර්ෂික ස්ථාන මාරුවීම් - 2023**
**ප්‍රධාන සුරාබදු පරීක්ෂක / සුරාබදු පරීක්ෂක**

2023 වර්ෂය සඳහා ස්ථාන මාරුවීම් ලැබීමට සුදුසුකම් ලත් ප්‍රධාන සුරාබදු පරීක්ෂක හා සුරාබදු පරීක්ෂකවරුන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර 01 පරිදි සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ස්ථාන භාර නිලධාරී, සුරාබදු අධිකාරී සහ සහකාර සුරාබදු කොමසාරිස් මගින් 2022.10.20 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන පරිදි එවිය යුතු ය.

02. දැනට බලපවත්නා ස්ථාන මාරු පරිපාටිය අනුව සේවා ස්ථානයක සේවය කළ යුතු සේවා කාලය පහත පරිදි වේ.

| | |
|---|---|
| සියලුම සුරාබදු ස්ථාන / විශේෂ මෙහෙයුම් ඒකක/ මත් ද්‍රව්‍ය නාශක අංශය සහ ප්‍රධාන කාර්යාලය | - එක් ස්ථානයක එක් වරකට අවුරුදු 03 බැගින් |
| සියලුම ස්කාගාර, නිෂ්පාදනාගාර සහ ගුදම් | - එක් ස්ථානයක එක් වරකට අවුරුදු 01 බැගින් |

03. වාර්ෂික ස්ථාන මාරු වලදී සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කල වර්ෂයේ ජනවාරි මස 01 දිනය. නමුත් නිලධාරියාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කල දිනය පසු දිනයක් වේ නම් මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි.

04. ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල උපරිම සේවා කාලය වසර 03 (තුනක්) සම්පූර්ණ කර ඇති නිලධාරීන් හා සියලු ම ස්කාගාර, නිෂ්පාදනාගාර සහ ගුදම්වල උපරිම සේවා කාලය වසර 01 සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලුම් කළ යුතු අතර, අනෙකුත් සේවා ස්ථානවල නිලධාරීන් ද වසර 03 ක් සම්පූර්ණ වූ පසු අනිවාර්ය ස්ථාන මාරුවීම්වලට යටත් වේ. තව ද, වසර තුනකින් ස්ථාන මාරුවීම් සිදු කරන සේවා ස්ථාන සඳහා 2022.12.31 දිනට වසර 2 ½ ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සහ වසර 01 කින් ස්ථාන මාරුවීම් සිදුකරන සේවා ස්ථාන සඳහා 2022.12.31 දිනට මාස 09ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලුම් කළ යුතු ය.

05. උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවන් හැර උතුරු පළාතේ සේවය කරනු ලබන අනෙකුත් නිලධාරීන් තම කැමැත්ත මත වසරකින් ස්ථාන මාරුවක් සඳහා ඉල්ලුම් කළ හැකි ය. එහෙත් එම නිලධාරියා කැමති නම් ඉදිරි වසර 2 හෝ වසරක් සඳහා සේවය කරන සුරාබදු ස්ථානය හෝ නිෂ්පාදනාගාරයක් හෝ වෙනත් සුරාබදු ස්ථානයක් ඉල්ලුම් කළ හැකි ය. තව ද එවැනි නිලධාරීන් සඳහා, ඔවුන් උතුරු පළාතේ සේවය කරන ස්ථාන, සේවා ස්ථාන වර්ගීකරණය අනුව එක් ස්ථානයක් පහළ දමා ඒ අනුව ලකුණු ගණනය කරනු ලැබේ.(උදා :- B2 ස්ථානයක සේවය කරන්නේ නම් B3 ස්ථානයකට අදාළ ලකුණු ගණනය කරනු ලැබේ.)

06. සේවා ස්ථාන වර්ගීකරණය
(සේවා ස්ථාන වර්ගීකරණය ඇමුණුම 01 හි දැක්වේ)

| | | |
|---|---|---|
| A. ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන | 45-100 | A1 - 100<br>A2 - 50<br>A3 - 45 |
| B. ප්‍රිය මනාප සේවා ස්ථාන | 25-35 | B1 - 35<br>B2 - 30<br>B3 - 25 |
| C. ප්‍රිය මනාප නොවන සේවා ස්ථාන | 5-15 | C1 - 15<br>C2 - 10<br>C3 - 05 |

(ලකුණු ගණනය කරන ආකාරය ඇමුණුම 02 හි දැක්වේ)

07. ලකුණු ගණනය කිරීමේදී ඇමුණුම 01 හා ඇමුණුම 02 අනුව ගණනය කරනු ලබන අතර "සේවා කාලය අවු.06 ට අඩු නිලධාරීන් සම්බන්ධයෙන් ලකුණු ගණනය කිරීමේ දී, මෙම ක්‍රමයෙන් බැහැරව ස්ථාන මාරු කරනු ලැබේ. පුරප්පාඩු පිරවීමේ දී අඩුම අවසන් ඇගයීමේ ලකුණු ලබා ගන්නා නිලධාරීන් ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප හා ප්‍රියමනාප නොවන සේවා ස්ථාන ලෙස ලකුණු අනුපිළිවෙළ අනුව ස්ථාන මාරු ලබා දෙනු ලැබේ. කිසියම් අවස්ථාවක අවසන් ඇගයීමේ ලකුණු සමාන වුවහොත් ජ්‍යෙෂ්ඨත්වයට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. තව ද, ඉතා ප්‍රියමනාප ස්ථානයක් සඳහා හිමිකමක් ඇති, එහෙත් ඊට වඩා අඩු බර තැබීමක් සහිත ස්ථානයක් ඉල්ලා සිටින නිලධාරියකුට ඒ සඳහා අවස්ථාව ලබා දිය හැකි අතර, අවසන් ඇගයීමේ ලකුණුවල ඊළඟ නිලධාරියාට එම අවස්ථාව ලබා දෙනු ලැබේ.

08. නිලධාරියකුගේ වත්මන් සේවා ගණයට අදාළ කාල සීමාව තුළ සේවය කරන ලද සේවා ස්ථාන පමණක් ස්ථාන මාරුවලදී සලකා බලනු ලැබේ. මුළු ලකුණු ප්‍රමාණය සේවා කාලයෙන් බෙදීමෙන් ලැබෙන මූලික ඇගයීමේ ලකුණුවලින් දැනට සිටින සේවා ගණයේ සේවා කාලය සඳහා සෑම වසරකටම ලකුණු 0.4 ක ප්‍රමාණයක් අඩු කිරීමෙන් අවසන් ඇගයීමේ ලකුණු ලබා ගනු ලැබේ.

09. වැටුප් රහිත විදේශ නිවාඩු ලබා සිටි නිලධාරියකුගේ මුළු සේවා කාලය ගණනයේ දී විදේශගතව සිටි කාල සීමාව අදාළ කරගනු නොලැබේ.

10. වසරක් තුළ සේවා ස්ථාන කිහිපයක සේවය කර ඇති නිලධාරියකු සම්බන්ධව ලකුණු ගණනය කිරීමේදී වැඩිම කාලයක් සේවය කරන ලද ස්ථානය පදනම් කර ගනිමින් ලකුණු ගණනය කරනු ලැබේ.

11. විනයානුකූල ක්‍රියා මාර්ගයක දී නිදොස්කොට නිදහස් කර නැවත සේවයේ පිහිටුවා ඇති නිලධාරියකුගේ සේවා කාලය ගණනයේදී වැඩ තහනම්ව සිටි කාලය ඔහුගේ මුළු සේවා කාලයට එකතු කරන අතර, එම වැඩ තහනම් වන අවස්ථාවේ සිටි සේවා ස්ථානය පදනම් කර ගෙන ලකුණු ලබා දෙනු ලැබේ. ජ්‍යෙෂ්ඨතාවයට දෙනු ලබන ලකුණු ද ගණනය කරනු ලැබේ.

12. ඉහත කොන්දේසි සැලකිල්ලට ගෙන 2023.01.01 දින සිට ස්ථාන මාරු කිරීමට නියමිත ප්‍රධාන සුරාබදු පරීක්ෂක සහ සුරාබදු පරීක්ෂකයින්ගේ නම් ලැයිස්තුවක් ඇමුණුම 03 වශයෙන් මේ සමඟ එවමි. මෙම ලැයිස්තුවේ නම් සඳහන් නොවුව ද 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන්නේ නම් ස්ථාන මාරු අයදුම් කිරීමට ඔබ විසින් කටයුතු කළ යුතු ය. එලෙස අයදුම් නොකරන්නේ නම් ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි සේවා කාලය සම්පූර්ණ කරන නිලධාරියකු ඕනෑම සේවා ස්ථානයකට ස්ථාන මාරු කළ හැකි ය.

13. නියමිත දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. අයදුම්පත ආකෘති පත්‍ර අංක 01 අනුව සකසා නිවැරදි තොරතුරු ඇතුළත් කර එවිය යුතු අතර ස්ථාන මාරුවීමට අපේක්ෂිත ස්ථාන දහයක් සඳහන් කළ යුතු ය. එහි විමසා ඇති සියලු තොරතුරු සඳහන් කළ යුතු අතර එසේ තොරතුරු සඳහන් නොකරන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ ඒ ස්ථානයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව, නිලධාරියා පෙර සේවය කරන ලද ස්ථාන අනුව ලැබූ ලකුණු සංඛ්‍යාව, පදිංචිය, කලත්‍රයාගේ සේවා ස්ථානය යන කරුණු සලකා බලා නිලධාරියා ස්ථාන මාරුකරනු ලබන සේවා ස්ථානය තීරණය කරනු ඇත. ඒ ඒ සේවා ස්ථානයන්හි පවතින පුරප්පාඩු හා ඒ සඳහා ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව සසඳන විට නිලධාරියා ඉල්ලුම් කරනු ලබන ස්ථානයම ලබාදිය නොහැකි වුවහොත් ඔබට සිදුවන අපහසුතාවයන් අවම කර ගැනීම සඳහා තමාට වඩාත්ම සුදුසු වන <u>ස්ථාන දහයක්</u> නම් කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු ය. ස්කාගාර, නිෂ්පාදනාගාර සහ ගුදම් සඳහා අයදුම් කරන්නේ නම් එම ස්ථාන හතරක් සමඟ සුරාබදු ස්ථාන හයක් තමන් කැමති පිළිවෙලට අනුව සඳහන් කළ යුතු ය.

එම්.ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

**එම්. ජේ. ගුණසිරි**
**සුරාබදු කොමසාරිස් ජනරාල්**
**ශ්‍රී ලංකා සුරාබදු** දෙපාර්තමේන්තුව
**අංක: 353**, කෝට්ටේ පාර, රාජගිරිය

පිටපත් :
01. සුරාබදු කොමසාරිස්වරුන්
02. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන්
03. සහකාර සුරාබදු කොමසාරිස්වරුන්
04. සුරාබදු අධිකාරීවරුන්
05. සුරාබදු ස්ථානාධිපතිවරුන්
06. අදාළ වෘත්තීය සමිතිවල ලේකම්වරුන්